ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.07.25 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 12-2017

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**2017 මැයි මස ඇතිවූ ජල ගැලීම් ,ගංවතුර හා නායයාම් තත්ත්වය මත විපතට පත් රාජ්‍ය නිලධරයන්ට විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබාදීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2017 හා 2017.06.28 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8/6හා 2017/07/24 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03. එමඟින් 2017 වර්ෂයේ මැයි මාසයේ දිවයිනේ විවිධ ප්‍රදේශවල අධික වර්ෂාව නිසා ඇතිවූ ජලගැලීම් ගංවතුර හා නායයෑම් නිසා විපතට පත්වූ රාජ්‍ය නිලධරයන්ට පොළී රහිත විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබා දීමට රජය තීරණය කර ඇත.

04.මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල 2017 වර්ෂයේ මැයි මාසයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් ජලගැලීම්,ගං වතුර හා නායයාම් නිසා ආපදාවට ලක්වූ රජයේ නිලධරයන් සඳහා පමණක් හිමිවන අතර , ස්ථිර නිලධාරීන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් හය ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන වාරික 36 කින්ද ,තාවකාලික හෝ අනියම් නිලධාරීන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් තුන් ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන මාසික වාරික 18 කින් ද ණය ලබා දුන් මාසයට ආසන්නතම ලිත් මාසයේ සිට ආපසු අයකර ගැනීමට යටත්ව ලබාදිය හැකිය.

05. මෙම ණය මුදල ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.5 උප වගන්තියේ සඳහන් පරිදි වැටුපෙන් අඩු කළ හැකි මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාවෙන් නිදහස් වේ.

06.අදාළ නිලධරයන් විසින් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍ර අංක 01 ප්‍රකාරව ප්‍රදේශීය ලේකම් විසින් සහතික කරන ලද තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිතව ඉල්ලීම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

07. රජයේ ස්ථිර නිලධරයන් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා ඇපකරුවන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.එසේ වුවද තාවකාලික හෝ අනියම් පදනම මත සේවයේ යෙදී සිටින නිලධරයන් මෙම ණය අත්තිකාරම් මුදල ලබා ගැනීමට නම් මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍ර අංක 02 ප්‍රකාරව රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති නිලධරයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

08.2017.08.31 දිනෙන් පසු මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නොකළ යුතුය.

09. මෙම චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

| | | |
|---|---|---|
| පිටපත් : | 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත | : දැ.ගැ.ස. |
| | 02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව | : දැ.ගැ.ස. |
| | 03.ප්‍රධාන ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් | : දැ.ගැ.ස. |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 14/2017

මගේ අංකය : EST-6/04/LON/1042

රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2017.06.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානින්

**2017 මැයි මස ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් තත්ත්වය මත විපතට පත් රාජ්‍ය නිලධරයන්ට විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබාදීම**

2017 මැයි මාසය තුළ දිවයිනේ විවිධ ප්‍රදේශවල අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් හේතු කොට ගෙන විපතට පත් වූ රාජ්‍ය නිලධරයන්ට පොළී රහිත විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබාදීමට රජය තීරණය කර ඇත.

02. මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ස්ථිර නිලධරයන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් හය ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන මාසික වාරික තිස් හයකින් (36) ද, තාවකාලික හෝ අනියම් නිලධරයන් සඳහා සිය මාසික මූලික වැටුප මෙන් තුන් ගුණයක ප්‍රමාණයට සමාන මුදලක් සමාන මාසික වාරික දහ අටකින් (18) ද ණය ලබාදුන් මාසයට ආසන්නතම ලිත් මාසයේ සිට ආපසු අයකර ගැනීමට යටත්ව ලබාදිය හැකි ය.

03. මෙම ණය මුදල ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3:5 උප වගන්තියේ සඳහන් වැටුපෙන් අඩු කළ හැකි මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාවෙන් නිදහස් වේ.

04. අදාළ නිලධරයා විසින් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍ර අංක 01 ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිතව ඉල්ලීම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

05. ආයතන ප්‍රධානියා, ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කරන ලද නිලධරයන්ගේ ඉල්ලීම් පරික්ෂා කර එහි නිරවද්‍යාතාව පිළිබඳව පෞද්ගලිකවම සෑහිමකට පත්විය හැකි නම් පමණක් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල අනුමතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

06. මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල 2017 වර්ෂයේ මැයි මාසයේ දිවයිනේ විවිධ ප්‍රදේශවල අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් නිසා ආපදාවට ලක් වූ නිලධරයන් සඳහා පමණක් සීමා කර ලබාදිය යුතු ය.

07. රජයේ ස්ථිර නිලධරයන් මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ලබා ගැනීම සඳහා ඇපකරුවන් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේ වුවද තාවකාලික හෝ අනියම් පදනම මත සේවයේ යෙදී සිටින නිලධරයන් මෙම ණය අත්තිකාරම් මුදල ලබා ගැනීමට නම් මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍ර අංක 02 ප්‍රකාරව රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති නිලධරයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

08. 2017.08.31 දිනෙන් පසු මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නොකළ යුතු ය.

09. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කෙරේ.

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ආකෘතිපත්‍ර අංක 01

**2017 මැයි මාසය තුළ අධික වර්ෂාව නිසා ඇති වූ ජල ගැලීම්, ගංවතුර හා නායයාම් හේතුවෙන් විපතට පත්වූ රාජ්‍ය නිලධරයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2017 අනුව විශේෂ ණය අත්තිකාරම් මුදලක් ඉල්ලුම් කිරීම**

01. නිලධරයාගේ සම්පූර්ණ නම : .....................................................................................................

02. තනතුර : .....................................................................................................

03. අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ නම : ...................................................

04. පත්වීමේ ස්වභාවය : ස්ථිර ☐ තාවකාලික ☐ අනියම් ☐

05. (i) රජයේ සේවයට පත් වූ දිනය :.....................................................................

(ii) සේවයේ ස්ථිර කළ දිනය :.....................................................................

06. සේවා ස්ථානයේ ලිපිනය : .....................................................................................................

07. පදිංචි ලිපිනය :

ස්ථිර :.....................................................................................................

.....................................................................................................

තාවකාලික :.....................................................................................................

.....................................................................................................

08. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.....................................................................................................

09. ආපදාවේ ස්වභාවය සහ හානි වූ දේපළ පිළිබඳ විස්තර : ...................................................

.....................................................................................................

10. නිලධරයා සමඟ ආපදාවට ලක් වූ පවුලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු :

| නම | නිලධරයාට ඇති සම්බන්ධතාව |
|---|---|
| | |
| | |
| | |
| | |

11. ආපදාවට පෙර අවසන්වරට සේවයට වාර්තා කළ දිනය :........................................................

12. ආපදාවෙන් පසු සේවයට වාර්තා කළ දිනය :...........................................................................

දිනය :........................ නිලධරයාගේ අත්සන :..............................

**13. ග්‍රාම නිලධාරීගේ නිර්දේශය :**

ඉහත නම් සඳහන් ............................................................මයා/මිය/මෙනවිය මාගේ ග්‍රාම සේවා වසමේ ස්ථිර පදිංචිකරුවෙකු වන අතර ඔහු/ඇය විසින් ආපදා තත්ත්වයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින් විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි.

නම :...........................................................

දිනය :.............................. අත්සන :..............................

(නිල මුද්‍රාව යොදන්න)

**14. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය :**

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/ එකඟ නොවෙමි. විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය :.............................. අත්සන :..............................

(නිල මුද්‍රාව යොදන්න)

**15. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

නිලධරයාගේ මාසික මූලික වැටුප :....................................................

ගෙවිය හැකි විශේෂ ණය අත්තිකාරම් මුදල :....................................................

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/ එකඟ නොවෙමි. විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය :..............................

..........................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

**16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**

......................................................................... මයා/මිය/මෙනවිය හට රු. ............................ක විශේෂ ණය අත්තිකාරම් මුදල ගෙවීම අනුමත කරමි/ නොකරමි.

නම :.......................................................................

තනතුර :.......................................................................

දිනය :........................................... අත්සන :..........................

(නිල මුද්‍රාව යොදන්න)

ආකෘතිපත්‍ර අංක 02

<u>ඇපකරුගේ ප්‍රකාශය ( රජයේ ස්ථිර නිලධරයන් සඳහා මෙම කොටස අදාළ නොවේ.)</u>

මෙම විශේෂ ණය අත්තිකාරම් මුදල ණයකරු විසින් මොනයම් අවස්ථාවක හෝ ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එසේ ගෙවීම පැහැර හරිනු ලබන දිනට පවතින ණය මුදලේ ශේෂය ණයලාභියා වාරික ගෙවීමට එකඟ වී ඇති පරිදි මාගේ වැටුපෙන් අයකර ගැනීමට එකඟ වෙමි.

01. ඇපකරුගේ නම :.............................................................................

02. දැනට දරන තනතුර : ............................................................................

03. දැනට සේවය කරන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව / පළාත් සභාව :.............................................................................

04. විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවයට පත් වූ දිනය :............................................................................

05. රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද දිනය : ............................................................................

06. රජය යටතේ විශ්‍රාම වැටුප් සහිත අඛණ්ඩ සේවා කාලය :............................................................................

07. ඇපවන මුදල :.............................................................................

08. අත්සන :..........................................

09. දිනය :..........................................

ඉහත ඇපකරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය :...............................

.........................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව
(ඇපකරු සේවය කරන අමාත්‍යාංශයේ/
දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ)